# 3 ශ්‍රී ලංකාවේ දේශපාලන බලය විකාශය වීම

### හැඳින්වීම

පැරණි කාලයේ දී රජවරුන් බොහෝ දෙනෙකු විසින් ද රැජිනන් කිහිපදෙනෙකු විසින් ද මෙරට පාලනය කරන ලද බව ඓතිහාසික මූලාශ්‍රය පෙන්වා දෙයි. ඉන්දියාවෙන් මෙහි පැමිණි විජය කුමරු මෙරට පාලනය කළ පළමුවන රජු ලෙස එම මූලාශ්‍රයවල විස්තර කර තිබේ. ඔහු මෙරටට පැමිණියේ ක්‍රිස්තු පූර්ව හයවන සියවසේ දී ය.

විජය කුමරු මෙහි පැමිණීමට පෙර මෙරට ජනාවාස පැවති බව පුරාවිද්‍යාත්මක සාක්ෂිවලින් තහවුරු වී තිබේ. ක්‍රිස්තු පූර්ව 2400 තරම් ඈත කාලයක සිට මෙරට කෘෂිකාර්මික සමාජයක් දියුණු වෙමින් පැවති බව බෙරගල, හල්දුම්මුල්ල ආදි ප්‍රදේශවලින් සොයා ගෙන තිබෙන පැරණි සොහොන් බිම්වලින් තහවුරු වී ඇත. එවැනි සමාජයකට අවුල් වියවුල්වලින් තොරව පැවතීමට නම් ඒ සමාජය පාලනය වීමට කිසියම් ක්‍රමයක් තිබිය යුතු ය. එහෙයින් මෙරට සමාජයේ දේශපාලන බලය දියුණු වීමේ ඉතිහාසය විජය කුමරුන්ගේ පැමිණීමට පෙර වකවානුවකට අයත් ය.

රටක් පාලනය කිරීමේ බලය රජුට හෝ රැජිනකට පවරා දෙනු ලබන්නේ එරටේ වෙසෙන මහජනයා විසිනි. කවරෙකුට වුව රටක් පාලනය කිරීමට පොදු මහජනතාවගේ කැමැත්ත අවශ්‍ය ය. මහජනයාගේ අප්‍රසාදය මත පාලන බලය හිමි කර ගන්නා පාලකයින්ට වැඩි කලක් එසේ රට පාලනය කිරීමට අවස්ථාවක් නොලැබුණු බව ඉතිහාසය අප වෙත පෙන්වා දෙයි. වැඩිදෙනෙකුගේ එකඟතාවෙන් පාලකයකු රට පාලනය කිරීමේ අයිතිය ලබා ගන්නා නිසා එවැනි පාලකයකු හැඳින්වීමට 'මහාසම්මත' යන වචනය පැරණි කාලයේ පෙරදිග රටවල භාවිත කර තිබේ. එසේ ජනසම්මතයෙන් පාලන බලය හිමි කර ගන්නා රජෙකු හෝ රැජිනක් විසින් පාලනය කරන භූමිප්‍රදේශයත්, එම පාලනයට සහභාගි වන විවිධාකාර නිලධාරි පිරිසත්, ජනතාවත් රාජ්‍යය යන නමින් හැඳින් වේ.

## 3.1 පූර්ව රාජ්‍ය සමය


ඉහත විස්තර කරන ලද නිර්වචනයට අනුව ශ්‍රී ලංකාවේ ඉතිහාසයේ රාජ්‍යය යන පදනම වර්ධනය වූයේ තරමක පසුකාලයක දී ය. ඒ පිළිබඳ මෙම පාඩමේ ඉදිරි කොටස්වල විස්තර කර තිබේ. මෙහි දී අවධානයට ගෙන තිබෙන්නේ එසේ රාජ්‍යයක් බිහි වීමට පෙර ශ්‍රී ලංකාවේ රට පාලනය කිරීමට අදාළව පැවති ස්වරූපය කුමක් ද යි පැහැදිලි කිරීම ය. එම කාලය පූර්ව රාජ්‍ය සමය නමින් හැඳින්වේ.

පූර්ව රාජ්‍ය සමයේ දී මෙරට පාලනය කිරීමට එක් නිශ්චිත පාලකයකු සිටියේ නැත. ඒ වෙනුවට කුඩා ප්‍රදේශවල සිය බලය පවත්වා ගෙන යන ලද්දේ වත්පොහොසත්කම් ඇති ප්‍රභූන් පිරිසක් විසිනි. මෙරට සෙල්ලිපි ලිවීම ආරම්භ වූ කාලයේ දී මෙම ප්‍රභූවරුන් ඒම සෙල්ලිපිවල හඳුන්වා දී තිබෙන්නේ 'පරුමක' යන නමිනි. පරුමක යන වචනය සෑදී තිබෙන්නේ සංස්කෘත භාෂාවේ 'ප්‍රමුඛ' යන පදයෙනි. එහි තේරුම 'ප්‍රධාන' යන්න යි. කුඩා ප්‍රදේශයක් වුව ද පාලනය කිරීමට බලයක් හිමි වූයේ ඔවුන් ධනවත් වීමත් ඒ නිසා ම හිමි වූ බලවත්කමත් නිසා ය.

පරුමකවරුන්ට කිසියම් ආකාරයක ප්‍රදේශීය පාලන බලයක් හිමිව තිබූ බව පෙන්වා දීමට උපයෝගි කර ගත හැකි සෙල්ලිපියක් දඹුල්ලට නුදුරුව පිහිටි කණ්ඩලම නමින් හැඳින්වෙන ප්‍රදේශයේ තිබෙන කොත්ගල්කන්දේ දක්නට ඇත. එම සෙල්ලිපිය ක්‍රිස්තු පූර්ව 250 ට අයත් වූවකි. එහි ඇති ගල්ගුහාවක් භික්ෂූන් වහන්සේලා වෙත පූජා කළ පරුමකයෙකු හඳුන්වා දී තිබෙන්නේ "තොට බොජක" යන නමිනි. එහි තේරුම "තීර්ථය අනුභව කරන්නා" යන්න යි. තීර්ථය යනුවෙන් හැඳින්වෙන්නේ තොටුපළ යි. අනුභව කිරීම යනුවෙන් පැරණි කාලයේ ව්‍යවහාර කරන ලද්දේ අය බදු ලබා ගැනීමත් දේපළ භුක්ති විඳීමත් ය. එසේ කළ හැක්කේ පාලන බලයක් සතු තැනැත්තෙකු හට පමණි. කණ්ඩලම සෙල්ලිපියේ දැක්වෙන පරුමකයා පැරණි කාලයේ ඒ ප්‍රදේශය පාලනය කළ තැනැත්තෙකු බව ඉන් පැහැදිලි වේ. බෞද්ධ භික්ෂූන් වහන්සේලා වෙත ගුහාවක් සකස් කර පූජා කිරීමට තරම් හැකියාවක් ඔහු සතු වූයේ ද ඒ නිසා ම බව වැටහේ.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.



*සිතුවම අංක 3.1 ගම්වල විසූ ගෘහපතීන් අතුරින් එක් පුද්ගලයකු ඒ ගමේ ප්‍රධානියා බවට පත් විය. ඔහු හැඳින්වූයේ ගමික නමිනි. එක් එක් ගම් අතර වැඩ කටයුතු කිරීමේ දී සම්බන්ධීකරණය පැවැත්වූයේ ගමිකයින් හරහා ය.*

පරුමකයන් පැරණි ශ්‍රී ලංකාවේ සමාජය තුළ බිහි වූයේ කුමන ආකාරයකට ද යි සොයා බැලීමෙන් මෙරට දේශපාලන බලය වර්ධනය වූ ආකාරය පහසුවෙන් තේරුම් ගත හැකි ය. එසේ තේරුම් ගැනීමට නම් පුරාණ කාලයේ පැවති මෙරට ග්‍රාමීය සමාජය සහ එහි ක්‍රියාකාරීත්වය සුපරීක්ෂාකාරීව හැදෑරිය යුතු ය.

## ගෘහපතියෝ

අවම තරමින් ක්‍රිස්තු පූර්ව 900 පමණ වන විට මෙරට ග්‍රාමීය ජනාවාස වියළි කලාපයේ බොහෝ ප්‍රදේශවල පැතිරී ගොස් තිබිණි. මේ ගම් සකස් වී තිබුණේ පවුල් කිහිපයකිනි. ඇතැම් විට පවුල් 1 සිට 30 දක්වා ප්‍රමාණයක් ඒවායේ ජීවත් විය. පවුල යන අදහස දීමට පැරණි කාලයේ භාවිත වූයේ කුල යන පදය යි. මේ සෑම පවුලක ම ප්‍රධානියා හඳුන්වන ලද්දේ "ගෘහපති" යන නමිනි. ක්‍රිස්තු පූර්ව 250 සහ ඊට ආසන්න පසුකාලීන සෙල්ලිපිවල ඔවුන් හඳුන්වා තිබෙන්නේ ගහපති යන වචනයෙනි. මේ සම්බන්ධයෙන් වැදගත් වන සෙල්ලිපියක් අනුරාධපුරයේ පෙරියපුලියන්කුලම නමින් හැඳින්වෙන ප්‍රදේශයේ දකින්නට ඇත. සුමනගේ පවුලට අයත්, ලෝහ වැඩ සිය රැකියාව ලෙස කළ ගෘහපතියකු භික්ෂූන් වහන්සේලාගේ සැපපහසුව වෙනුවෙන් ගල්ගුහාවක් පිරිසිදු කොට පූජා කළ බව එහි සඳහන් ය. ගමක පොදු කටයුතුවල දී එක් එක් පවුල නියෝජනය කිරීමට ඉදිරිපත් වූයේ මෙකී ගෘහපතීන් ය. සරලව කිවහොත් ගෘහපතීන් යනු පවුල් ප්‍රධානීන් ය.

## ගමිකයෝ


පැරණි සෙල්ලිපිවල මෙන්ම අටුවාකථාවල ද 'ග්‍රාමික' හෝ 'ගමික' යන නමින් හඳුන්වන ලද පිරිසක් පිළිබඳව සඳහන් ය. ඒ පැරණි ගම්වල ජීවත් වූ ගම් ප්‍රධානීන් ය. පැරණි ගම් පැවතියේ එකිනෙකට වෙන් වෙන් වශයෙනි. ගමක් තවත් ගමකින් වෙන් වූයේ

පටු කැලෑ තීරයකිනි. මෙසේ වෙන් වී පැවතීම නිසා එක් එක් ගම්වල ජීවත් වූ වැසියන් මෙම වෙන් වීම තේරුම් ගත්තේ අපේ ගම (තමන් විසූ ගම) අල්ලපු ගම (යාබදව පිහිටි ගම) සහ පිටගම් (ඈතින් පිහිටි ගම්) යනාදි වශයෙනි. ගම් අතර පැවති කටයුතුවල දී එනම් ආවාහවිවාහ කටයුතු, භාණ්ඩ හුවමාරු කර ගැනීම් මෙන් ම විවිධ ආරවුල් විසඳීම ආදි දේ වල දී එක් එක් ගම් නියෝජනය කිරීමට ක්‍රියා කළ පුද්ගලයා ග්‍රාමික යන නමින් හැඳින්වූ බව පෙනේ. එහි තේරුම ගම් නායකයා යන්න යි.

ගමක් නියෝජනය කිරීමට නායකයකු තෝරා ගන්නා ලද්දේ ගෘහපතීන් අතරිනි. එලෙස තෝරා ගැනීමේ දී අවධානය යොමු කරන ලද්දේ ගෘහපතීන් සතු වත්පොහොසත්කම වීමට ඉඩ තිබේ. පැරණි ගමක ජීවත් වූ දිළිඳු වැසියෙක් ඊළඟ කන්නයේ ලබා දෙන පොරොන්දුව පිට ඒ ගමේ විසූ ගමිකයාගෙන් වී මල්ලක් ණයට ඉල්ලා ගත් පුවතක් ජාතකට්ඨකථාවේ දැක්වේ. ගමිකයින් යනු අන් අයට පවා උදව් කළ හැකි තරමට ධනවත් වූ පිරිසක් බව ඉන් වටහා ගත හැකි ය.

කණ්ඩායමක් නිවැරදි ආකාරයට හසුරුවා ගැනීමට නම් එම කණ්ඩායමේ පොදු විශ්වාසය දිනා ගත් පුද්ගලයෙකු ඊට නායකත්වය ලබා දිය යුතු ය. ගමක ගෘහපතින් සියලු දෙනා එක්ව ගම වෙනුවෙන් තීරණ ගැනීම වෙනුවට ගෘහපතින්ගේ එකඟතාවෙන් ගමේ

*සිතියම අංක 3.1 වර්ෂා ජලයෙන් පෝෂණය වන කුඩා ගම්වැව්වලින් කළ හැකි වැඩ කොටස තවදුරටත් පුළුල් කිරීමට එම ගම්වැව් ඇළ මාර්ගවලින් සම්බන්ධ කෙරිණි. එවැනි වැව් පද්ධතියක් හැඳින්වීමට භාවිත කරන්නේ වැව් ප්‍රපතනය යන නමයි. ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ ගැමියෝ ඒ සඳහා එල්ලංගාව යන වචනය ද භාවිත කරති. මෙහි දැක්වෙන්නේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ පිහිටි එවැනි වැව් ප්‍රපතනයකි.*



ජීවත් වන වඩා ධනවත් හා බලවත් පුද්ගලයා ඒ සඳහා පත් කර ගැනීමට අපේ පුරාණ ගම්වැසියන් කටයුතු කර තිබේ. ගමිකයින් ගෘහපතින් අතරින් ම පත් වූ කෙනෙකු බව බුද්ධඝෝෂ හිමියන් විසින් සමන්තපාසාදිකාවේ සඳහන් කර තිබේ.

ගමිකයින් ඉටු කළ කාර්යයන් අතර ඒ ඒ ගම්වල පොදු කටයුතුවලට නායකත්වය දීම විශේෂයෙන් වැදගත් විය. ගමට අයත් වැව නඩත්තු කිරීම, ඉන් ජලය බෙදා හැරීම, ඉන් ප්‍රධාන වූ බව පෙනේ. ගම්වල පැවති ආරවුල් විසඳීම ආදී දේ ඇතුළු මෙවැනි කටයුතුවලට නායකත්වය දීමත් ඔහු සතුව තිබූ ධනවත් බවත් නිසා ඔහු වටා කිසියම් පාලන බලයක් ගොඩ නැගුණු අන්දම පැහැදිලි ය.

ඒ ඒ ගම්වල විසූ ගම් නායකයින් එකිනෙකා සමග සුහදව කටයුතු කිරීම ගම් අතර සාමය සහ සහජීවනය පවත්වා ගැනීමට මහත් සේ ඉවහල් විය. හම්බන්තොට දිස්ත්‍රික්කයට අයත් සිතුල්පව්වේ පිහිටි පැරණි බෞද්ධ විහාරයට අයත් කොරවක්ගල නමින් හැඳින්වෙන ප්‍රදේශයේ තිබෙන ගල්ගුහාවක මේ කරුණ සනාථ කර ගැනීමට ඉවහල් වන සාක්ෂියක් තිබේ. එම ගල්ගුහාව පිරිසිදු කොට භික්ෂූන් වහන්සේලා වෙත පූජා කිරීමට පුද්ගලයින් තිදෙනෙක් සහභාගි වී තිබේ. ඒ ගමික සිව, ගමික සුමන සහ ගමික තිදන යි. මොවුන් තිදෙනා සිතුල්පව්වට යාබද අසල්වාසී ගම්වල නායකයින් වන්නට ඇත. මෙවැනි ගම්නායකයින් බිහි වීම මෙරට දේශපාලන බලය වර්ධනය වීමේ ඉතා වැදගත් තීරණාත්මක අවස්ථාවකි.

## පරුමකවරු

පැරණි කාලයේ මෙරට සමාජයේ දේශපාලන බලය වර්ධනය වීම සම්බන්ධයෙන් පරුමක නමින් හැඳින්වූ ප්‍රභූන් පිරිසක් වැදගත් වන බව ඉහත සඳහන් කරන ලදී. එවැනි ප්‍රභූ පැලැන්තියක් බිහි වීම සහ ඔවුන්ට පාලන බලයක් හිමි වීම සිදු වුයේ කෙසේ දැ යි යන්න සොයා බැලීම මෙහි දී වැදගත් ය.

මේ කරුණ ගැන සොයා බලා තිබෙන විද්වතුන් සියලු දෙනාගේ ම අදහස වී තිබෙන්නේ පරුමකවරුන්ගේ බිහි වීමත්, පුරාණ කාලයේ පැවති වැව් නඩත්තු කිරීමත් අතර සබඳතාවක් තිබෙන බව යි. ඇත්තෙන් ම එය එසේ වූයේ කෙසේ ද?

ක්‍රිස්තු පූර්ව 900 පමණ කාලයේ දී මෙරට වියළි කලාපයේ ජනාවාස පැතිර ගියේ කුඩා වැව් කේන්ද්‍ර

කර ගෙන ය. මේ වැව් පෝෂණය වූයේ වැසි දියෙනි. සාමාන්‍යයෙන් ගමක ජීවත් වූ පවුල් 1015 ත් අතර ප්‍රමාණයකට ඔවුන්ගේ එදිනෙදා ජීවන අවශ්‍යතා පිරිමසා ගැනීමට එවැනි වැව්වල තිබූ ජලය කෙටි කාලයකට ප්‍රමාණවත් විය. වාර්ෂිකව එළැඹෙන වියළි කාලවල දී මේ වැව් සිඳී ගියේ ය. එවැනි අවස්ථාවල එම වැව් ආශ්‍රිතව ජීවත් වූ ජනතාව මහත් අසීරුතාවලට මුහුණ දුන් බව අදත් වියළි කලාපයේ පැරණි වැව් ආශ්‍රිතව ජීවත්වන ජනතාව මුහුණ දෙන අත්දැකීම්වලින් පැහැදිලි වේ.

කුඩාවැව්වලට වර්ෂාකාලයේ දී පුරවා ගන්නා ජලය ප්‍රමාණවත් නොවීමේ ගැටලුවට මුහුණ දීමට සිදු වූයේ වියළි කාලගුණ තත්ත්වය නිසා පමණක් ම නොවේ. කාලයක් යාමේ දී ගම්වල ජනගහනය ඉහළ යෑම නිසා ද පරිභෝජනය සඳහා වැඩි ජල ප්‍රමාණයක් අවශ්‍ය විය. ඉහළ යන ජනගහනයකට වැඩියෙන් ආහාර නිපදවීම අවශ්‍ය වූ නිසා වැඩි භූමි ප්‍රමාණයක් වගා කළ යුතු හෙයින් ඊට සුදුසු ප්‍රමාණවත් ජල ප්‍රමාණයක් රඳවා ගැනීම අත්‍යවශ්‍ය විය. මෙවැනි අවශ්‍යතා ඉදිරියේ උද්ගතවන දුෂ්කරතාවලට වරක් දෙවරක් නොව කිහිපවරක් මුහුණ දුන් අපේ පුරාණ ගම්වැසියෝ එම අභියෝගයට මුහුණ දීම සඳහා සාර්ථක ක්‍රමයක් අනුගමනය කළහ. ඒ තනිව පවතින වැවක් වෙනුවට සමීපව තිබෙන වැව් කිහිපයක් ඇළ මාර්ගවලින් සම්බන්ධ කොට වැව් පද්ධතියක් සෑදීම යි. එහි අරමුණු දෙකක් තිබිණි. පළමුවැන්න භූමියක ඉහළින් පිහිටි වැවක් වැසි දියෙන් පිරුණු විට ඉන් බැහැරට ගලා යන ජලය පහළින් ඇති වැවට හරවා ජලය සංරක්ෂණය කර ගැනීම යි. දෙවැන්න වැව් දෙකක් අතර ඇළ මාර්ගයේ නිරන්තරයෙන් ජලය ගලා යාමට සලස්වා ඇළ දෙපස භූමියේ තෙතමනය ඉහළ දැමීම යි. එසේ තෙතමනය ඉහළ නැංවීමෙන් එම ප්‍රදේශවල පහසුවෙන් බෝග වගා කළ හැකි විය. පුරාණ කාලයේ මෙලෙස සකස් කරන ලද වැව්පද්ධති වියළි කලාපයේ නටබුන්ව තිබෙනු අදත්




*ඡායාරූපය අංක 3.1  දඹුල්ලේ පිහිටි ඉබ්බන්කටුව සුසාන භූමිය ක්‍රිස්තු පූර්ව 700450 අතර කාලයේ භාවිත කළ එකකි. මෙවැනි සුසාන භූමි එකල සමාජයේ විසූ පරුමකයින් වැනි ප්‍රභූන් විසින් භාවිත කළ ඒවා යි.*

දැකිය හැකි ය. මෙවැනි වැව් පද්ධතියක් හැඳින්වීමට 'වැව් ප්‍රපතනය' යන නම භාවිත වේ. වියළි කලාපයේ වැසියන් ඒවා හඳුන්වන්නේ 'එල්ලංගාව' යන නමිනි. වැව්පද්ධති බිහි වීම යනු හුදෙක් ම කුඩා වැව් කිහිපයක් එකිනෙක සම්බන්ධ වීම පමණක් ම නොවේ. ඒ පිටුපස ඉතා වැදගත් දෙයක් සිදු වෙමින් තිබිණි.

වියළි කලාපයේ එකිනෙකට ස්වාධීනව පැවති කුඩා ගම් ගැන මීට ඉහත සඳහන් කෙරිණි. මේ සෑම ගමකට ම අයත් කුඩා වැවක් පිහිටි බව ද එහි දී කියැවිණි. වැව් පද්ධති නිර්මාණය වීමේ දී සිදු වූයේ එවැනි ස්වාධීන ගම්වලට අයත් වැව් කිහිපයක් ජලය ගලා බසින ලෙස සමෝච්ච රේඛා අනුව එකට සම්බන්ධ කිරීම යි. එහි දී ඒ එක් එක් ගම් නායකයින් අතර සාකච්ඡා කිරීමත්, සම්බන්ධ කිරිමට නියමිත කුඩා වැව්ගම්මාන කිහිපයකට පොදු වන පරිදි යම් යම් වැදගත් තීරණ ගැනීමේ අවශ්‍යතාවත් පැන නැගීම ස්වාභාවික ය. ශ්‍රී ලංකාවේ පැරණිත ම සෙල්ලිපිවල දක්වෙන කරුණු විමසිල්ලෙන් පරීක්ෂා කරන විට පෙනෙන්නේ මේ අවස්ථාවේ දී එකී ගම්වල විසූ ගමිකයින් අතුරින් වඩා බලවත් තැනැත්තා එක් වැව් පද්ධතියකට අයත් ගම් සියල්ල නියෝජනය කිරීමට කටයුතු කර තිබෙන බව යි. මේ තැනැත්තා හැඳින්වූයේ පරුමක යන නමිනි. වැව්පද්ධතියක් සහ ඊට අයත් ගම් කිහිපයක ජීවත් වූ වැසියන්ගේ සුභසිද්ධිය වෙනුවෙන් තීරණ ගැනීමට බලයක් පැවරී තිබුණු නිසා පරුමකයන් එකල සමාජයේ බලවත් ප්‍රභූන් පිරිසක් ලෙස සැලකිණි.

වියළි කලාපයට අයත් තැනිතලා භූමියේ මෙවැනි වැව්පද්ධති සිය ගණනක් නටබුන්ව තිබෙනු අදත් දැකිය හැකි ය. එයින් පැහැදිලි වන්නේ ඒවා භාවිතයේ පැවති කාලවල දී ඒ සෑම වැව්පද්ධතියකට ම අයත් පරුමකයෙක් සිටි බව ය. මෙලෙස බිහි වූ පරුමකවරු සියගණනක් පිළිබඳ තොරතුරු පැරණි සෙල්ලිපිවල දක්නට තිබේ. පිරිමින් පමණක් නොව ඇතැම් අවස්ථාවල කාන්තාවන් ද ප්‍රාදේශීය පාලනයට



*සිතුවම අංක 3.2 ගමිකයින් අතරින් බිහි වූ ප්‍රධානීන් හැඳින්වූයේ පරුමකයින් නමිනි. බදු අය කර ගැනීමේ බලය ඔවුන් සතුව පැවතිණි. පසුකාලීන දේශපාලන බලය වර්ධනයේ වැදගත් ආරම්භයක් පරුමකවරු මගින් සංකේතවත් කෙරේ.*



ඡායාරූපය අංක 3.2 ඉබ්බන්කටුව සුසාන භූමියෙන් සොයා ගන්නා ලද මෙම මාලය ක්‍රිස්තු පූර්ව 700450 අතර කාලයට අයත් වූවකි. පබළු මාලයක් වූ මෙහි දක්නට තිබෙන ඇතැම් පබළු ආනයනය කරන ලද ඒවා යි. වර්ධනය වන ප්‍රභූන්ගේ ජීවිතයේ සුඛිත මුදිත ස්වරූපය මින් පිළිබිඹු වේ.

හවුල් වී තිබේ. එවැනි කාන්තාවන් හඳුන්වන ලද්දේ පරුමකලු නමිනි. සමස්තයක් ලෙස ගත් විට ඒ සියලු දෙනා වියළි කලාපයේ ජනාවාස පැතිරී තිබූ ප්‍රදේශවල කුඩා භූමි ඒකක පාලනය කළ පුද්ගලයින් ය. මේ අනුව ශ්‍රී ලංකාවේ දේශපාලන බලයේ විකාශනය ආරම්භ වූයේ බෙදී ගිය ක්‍රමයක් ලෙස ය. එවැනි ක්‍රමයක් හැඳින්වීමට වඩා සුදුසු ව්‍යවහාරය වන්නේ විමධ්‍යගත පාලනය යන්න යි.

මේ ආකාරයට මෙරට ප්‍රාදේශීය පාලනය ගෙන ගිය පරුමකවරුන්ගේ බලය වර්ධනය වූ ආකාරය කෙතෙක් ද යත් ඇතැම් අවස්ථාවල ඔවුන් "රජ" යන පදයෙන් තමන්ව හඳුන්වාගෙන තිබේ. මාතලේ දිස්ත්‍රික්කයට අයත් ඇඹුල්අඹේ නමින් හැඳින්වෙන ප්‍රදේශයේ තිබෙන එක්තරා පැරණි සෙල්ලිපියක 'පොචනි රජ' යනුවෙන් හැඳින් වූ ප්‍රාදේශික පාලකයෙකු ගැන සඳහන් වේ. එහි අදහස ප්‍රාචීන රජ හෙවත් නැගෙනහිර ප්‍රදේශයේ රජු යන්නයි. කෑගල්ලේ පිහිටි යටහලෙන නම් පැරණි බෞද්ධ විහාරයේ තිබෙන ගල්ගුහාවක ද 'දුහතර රජ' නමින් සඳහන් කළ තවත් එවැනි ම ප්‍රාදේශික පාලකයකු ගැන අසන්නට ලැබේ.

'රජ' යන පදයෙන් සතුටු කරන්නා යන අදහස ලැබේ. ජනතාවගේ සුභසිද්ධිය ගැන අනලස්ව කටයුතු කොට ඔවුන් සතුටට පත් කරන්නා හැඳින්වීමට රජ යන පදය යොදා තිබේ. පරුමකවරුන් එසේ ක්‍රියා කළ නිසා පසුකලෙක ඔවුන් හැඳින්වීමට එවැනි ව්‍යවහාරයක් භාවිත කර තිබේ. පසුකාලයේ ශ්‍රී ලංකාව පාලනය කළ අභීත රජවරු පරම්පරාවක් බිහි වීමට තුඩුදුන් එහි ආරම්භය සකස් වන්නේ මෙවැනි පසුබිමක ය.

### රාජ්‍යත්වයේ වර්ධනය

රාජ්‍යත්වයේ වර්ධනය යනු විකේන්ද්‍රගතව තිබූ බලය මධ්‍යගත වීම යි.

දේශපාලන බලය මධ්‍යගත වීම යනු රට එක්සේසත් කිරීම යන අදහසට සමාන වේ. මින් අදහස් වන්නේ බලය එක් පුද්ගලයෙකුගේ අණසක යටතට පත් වීමයි. බලය මධ්‍යගත වීමෙන් රාජ්‍යය යන යාන්ත්‍රණය නිර්මාණය වේ. එහි පාලන ප්‍රධානියා රජු වන අතර ඔහුගේ පාලනයට යටත් වූ නිශ්චිත භූමි ප්‍රදේශයක් සකස් වේ.

ඓතිහාසික මූලාශ්‍රයවල විස්තර කර තිබෙන පරිදි මෙරට පාලනය කළ ප්‍රථම රජු පණ්ඩුකාභය යි. මහාවංසයේ සඳහන් විස්තරය අනුව එ රජු,

1. ප්‍රදේශීය පාලකයින් කිහිපදෙනෙකු (මාමාවරුන්) හා සටන් කර ඒ ප්‍රදේශ අත්පත් කර ගනිමින් රජ බවට පත් විය.


2. සිය පාලන මධ්‍යස්ථානය ලෙස අනුරාධපුරය තෝරා ගෙන අනුරාධපුර නගරය ගොඩනැගීය.

3. තමන්ගේ දසවෙනි රාජ වර්ෂයේ දී දිවයිනේ ග්‍රාම සීමා සටහන් කිරීම සිදු කළේය.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

දේවානම්පියතිස්ස රාජ්‍ය සමය වන විට දේශපාලන බලය මධ්‍යගත වීමේ අවශ්‍යතාව තවදුරටත් වර්ධනය විය. ඒ සඳහා ප්‍රධාන හේතුවක් ලෙස එවක ඉන්දියානු සාගරයේ වර්ධනය වෙමින් තිබූ වෙළෙඳාම පෙන්වා දිය හැකි ය. නැගෙනහිර සහ බටහිර රටවල් යා කරමින් ඉන්දියානු සාගරය හරහා වැටී තිබුණු මුහුදු




*විමධ්‍යගත පාලන බලය බුක්ති විඳිමින් සිටි පරුමකවරුන් මධ්‍යගත පාලනයට සම්බන්ධ කර ගැනීමෙන් කේන්ද්‍රීය රාජ්‍ය පාලනයක් ඇති කිරීමට දුටුගැමුණු රජු සමත් විය.*

වෙළෙඳ මාර්ගයේ මැද පිහිටි රටක් වීම හා ශ්‍රී ලංකාව සතුව තිබූ මැණික්, ඇතුන් සහ කුළුබඩු වෙළෙඳුන්ගේ සිත් ඇදගත් වෙළෙඳ භාණ්ඩ බවට පත්ව තිබීම නිසා ද ජාත්‍යන්තර වෙළෙඳුන්ගේ අවධානයට ශ්‍රී ලංකාව යොමු විය. නැගී එන මෙම ජාත්‍යන්තර වෙළඳාමට සම්බන්ධ වීමේ දී ස්වාධීන රටක් ලෙස කටයුතු කිරීමේ අවශ්‍යතාව පැන නැගිණි. මේ සඳහා මුළු රට ම ඒකීය පාලනයකට නතු වීමේ අවශ්‍යතාව ඒ වන විට ප්‍රබලව සිටි ඇතැම් ප්‍රාදේශීය පාලකයින්ට වැටහී තිබිණි. ශ්‍රී මහාබෝධීන් වහන්සේ රෝපණය කරන අවස්ථාවේ දේවානම්පියතිස්ස රජු කතරගම සහ චන්දනගම ක්ෂත්‍රියන්ට ඒ සඳහා ආරාධනා කළ බව මහාවංසයේ සඳහන් ය. එපමණක් නොව ශ්‍රී මහාබෝධීන් වහන්සේගේ ශාඛා දිවයිනේ විවිධ ප්‍රදේශවල රෝපණය කිරීමට එරජු ක්‍රියා කළ බව ද අපි දනිමු. සියලු ම ප්‍රාදේශීය පාලයින් අතර සුහදතාව ගොඩ නැගීමේ අවශ්‍යතාව දේවානම්පියතිස්ස රජතුමා කල්පනා කළ බව මෙයින් පැහැදිලි වේ. එවක ඉන්දියාව පාලනය කළ ප්‍රතාපවත් අධිරාජයෙකු වූ අශෝක රජතුමා විසින් එවන ලද පංච කකුධ භාණ්ඩ භාවිත කොට දේවානම්පියතිස්ස රජතුමා නැවත අභිෂේක වීම, අශෝක රජතුමා විසින් භාවිත කරන ලද දෙවනපිය යන අභිධානය භාවිතයට ගැනීම හා මිහිඳු මාහිමියන් බුදුදහම රැගෙන මෙරටට වැඩම කිරීම යන කරුණු ඉන්දියානු සාගර කලාපයේ රටවල් අතර එවක වර්ධනය වෙමින් පැවති සබඳතාවල ස්වරූපය පෙන්නුම් කරයි.

විමධ්‍යගතව පැවති ශ්‍රී ලංකාවේ දේශපාලන බලය එක් නිශ්චිත පුද්ගලයකු වෙත යොමු වීමේ ක්‍රියාවලියේ තවත් එක් නියමුවෙකු ලෙස දුටුගැමුණු රජු හඳුන්වාදිය හැකිය. එතුමා ඒ සඳහා එවක සිටි පරුමකවරුන්ගේ සහයෝගය ලබා ගත්තේ ය. මේ බව පැහැදිලි කිරීමට ප්‍රමාණවත් උදාහරණ එරජුගේ පාලන කාලයට අයත් සෙල්ලිපිවල දකින්නට තිබේ.

රට එක්සත් කිරීම පිළිබඳ දුටුගැමුණු රජුගේ වැඩකටයුතුවලට සහභාගි වූ සෙන්පතිවරු එවැනි තනතුරු ලැබීමට පෙර පරුමකවරුන් ලෙස කටයුතු කළ හ. වේළුසුමන, ඵුස්සදේව, ථෙරපුත්තාභය සහ නන්දිමිත්‍ර යන සෙන්පතිවරුන් පරුමකයින් ලෙස සෙල්ලිපිවල හඳුන්වා දී තිබේ. එවැනි සෙල්ලිපි කිහිපයක් සිතුල්පව්වේ පිහිටි ගල්ගුහාවල දක්නට ඇත. දුටුගැමුණු රජු විසින් විවිධ දක්ෂතා තිබෙන එවැනි පරුමකවරුන්ගේ සහාය ලබා ගෙන එතෙක් විමධ්‍යගතව තිබූ දේශපාලන බලය මධ්‍යගත කළේ ය. බලය විමධ්‍යගතව පැවති අවධියේ දී පරුමක තත්ත්වයේ සිටි ප්‍රාදේශික ප්‍රභූ නායකයෝ බලය මධ්‍යගත වූ පසු රජයේ විවිධ තනතුරු දරන්නන් බවට පත් වූහ. පරුමක ඵුස්සදේව පරුමක වේළුසුමණ පරුමක ථෙරපුත්තාභය ආදින් පසුකලෙක සේනාපති පරුමක ඵුස්සදේව, සේනාපති




*ඡායාරූපය අංක 3.3 මෙම ඡායාරූපයේ දක්වෙන්නේ පැරණි කාලයේ භාවිතයට ගන්නා ලද මැටි මුද්‍රා කිහිපයකි. සොයාගන්නා ලද අවස්ථාවේ ඒවායේ කිසිවක් සටහන්ව නොතිබිණි. මෙවැනි මුද්‍රා භාවිත කර තිබෙන්නේ රජයේ නිලධාරීන් විසිනි. මෙම මුද්‍රා තුන සොයාගන්නා ලද්දේ තිස්සමහාරාමයේ පැරණි නාගරික ගොඩැල්ල පැවති තැනින් ය.*

පරුමක වේළුසුමණ සහ පරුමක ෆෙරපුත්තාභය යනුවෙන් ව්‍යවහාර කරන ආකාරය සමකාලීන සෙල්ලිපිවල දක්නට තිබේ. එමෙන්ම පරුමක තනතුර දරූ භාණ්ඩාගාරිකයින්, අයකැමියන්, සහ ගබඩා පාලකවරුන් ගැන ද සෙල්ලිපිවල සඳහන් ය. සාහිත්‍ය මූලාශ්‍රය අනුව ද දිවයින ම එක් සේසත් කළ ප්‍රථම පාලකයා ලෙස හඳුන්වා ඇත්තේ දුටුගැමුණු රජතුමා ය.

මෙලෙස පැරණි ශ්‍රී ලංකාවේ දේශපාලන බලය මධ්‍යගත කිරීම සඳහා දුටුගැමුණු රජතුමා සාධනීය පියවරක් තැබීය. භාතිකාභය රජුගේ පාලන කාලයේ දී ශ්‍රී ලාංකික තානාපතිවරයෙක් රෝමයට ගොස් වීදුරු පබළු රැගෙන ආ බව මූලාශ්‍රයවල සඳහන් ය.

දේශපාලන බලය මධ්‍යගත වීම තවදුරටත් සාර්ථක තත්ත්වයකට පරිවර්තනය කරනු ලබන්නේ වසභ රජතුමා විසිනි. එතුමාගේ පාලන කාලයේ දී සමස්ත ශ්‍රී ලංකාව ම එක් ඒකකයක් ලෙස ක්‍රියාත්මක විය. වසභ රජතුමා විසින් පිහිටුවන ලද සෙල්ලිපි මෙරට පුළුල් ප්‍රදේශයක පැතිරී තිබේ. එමෙන්ම පරිපාලන දිස්ත්‍රික්ක (ආස්ථාන) වෙන් කොට ඒ එක් එක් දිස්ත්‍රික්ක පාලනය කිරීමට ඇමතිවරු පත් කිරීම ද සිදු වූයේ මෙරජුගේ පාලන කාලයේ දී ය. වසභ රජතුමාගේ කාලයේ දී යාපනය ප්‍රදේශය පාලනය කරන ලද්දේ එතුමා විසින් පත් කරන ලද ඍෂිගිරි නම් ඇමතිවරයා විසින් බව වල්ලිපුරම් රන්පතේ ලියා තිබේ. ඒ කාලයේ යාපනය අර්ධද්වීපය හැඳින්වූයේ නාගදීපය (නකදිව) යනුවෙනි.

ස්වාධීන රටක් ලෙස ලෝකය හමුවේ පෙනී සිටින්නට ශ්‍රී ලංකාවට හැකි වූයේ මෙලෙස දේශපාලන බලය මධ්‍යගත වීම නිසා ය.



*ඡායාරූපය අංක 3.5 රුවන්වැලිසෑයට මහා පූජාවක් කළ භාතිකාභය රජතුමාගේ පිළිරුව. මෙම ප්‍රතිමාව දැනටත් රුවන්වැලිසෑයේ මළුවේ දක්නට තිබේ.*

## 3.2 රාජ්‍යත්ව සංකල්පය

දේශපාලන බලය මධ්‍යගත වීමේ දී පහළ වන මහරජු ඉතා බලවත් පුද්ගලයෙකි. එහෙයින් රජු සිය ජනතාව ඉදිරියේ පෙනී සිටීමට වෑයම් කර තිබෙන්නේ බලසම්පන්න ස්වරූපයකිනි. රට ආර්ථික වශයෙන් දියුණු කිරීම, රටවැසියාට ආරක්ෂාව සැපයීම, රටවැසියාගේ ආධ්‍යාත්මික සංවර්ධනය ගොඩනැංවීම ආදි දේ තමන්ගෙන් රටවැසියාට ඉටු විය යුතු යුතුකම් ලෙස පාලකයෝ කල්පනා කළහ.

පරසතුරු උවදුරු අවස්ථාවල දී ආරක්ෂාව සලසා දීම වැව් අමුණු ඉදි කර ආර්ථික සංවර්ධනය කිරීම සහ වෙහෙර විහාර ඉදි කරමින් ජනතාවගේ ආධ්‍යාත්මය පෝෂණය කිරීම මීට උදාහරණ වේ. එළාර, නිශ්ශංකමල්ල ආදි විදේශ සම්භවයක් ඇති රජවරු පවා ඉහත කී ආකාරයට කටයුතු කිරීමෙන් ජනතා විශ්වාසය ගොඩ නගා ගත් ආකාරයට ඉතිහාසය සාක්ෂි දරයි.



*ඡායාරූපය අංක 3.4 තිස්සමහාරාමයේ පැරණි මාගම නගරය පැවති තැනින් සොයා ගන්නා ලද මැටි මුද්‍රාවක්. රුහුණේ රාජකීයයන් විසින් භාවිත කරන ලද සංකේත කිහිපයක් මෙම මුද්‍රාවේ සලකුණු කර තිබේ නොමිලේ බෙදා හැරීම සඳහා ය.*

රජවරුන්ගේ ක්‍රියාකලාපය සහ පෙනී සිටීමට උත්සාහ කළ ස්වරූපය අනුව රාජ්‍යත්වය පිළිබඳ විවිධ සංකල්ප ගොඩනැගී ඇත. ඒ අනුව දේවත්ව, බෝධිසත්ව, පර්වතරාජ, වීරත්ව සහ චක්‍රවර්තී වැනි සංකල්ප රජවරුන්ට ආරෝපණය විය.

පාලනය කිරිමේදී රජු දෙවියෙකු ලෙස හෝ බෝධිසත්ත්වයෙකු ලෙස පෙනී සිටීම සුලබව දැකිය හැකි ය. දඹුලු විහාරයේ පර්වතයක ඇති සෙල්ලිපිය පිහිට වූ කුටකණ්ණ අභය රජතුමා එහි තමන් හඳුන්වා දී තිබෙන්නේ නරේශ්වර (නරඉසෙර) යන නමිනි. එහි තේරුම නරයින්ට ඊශ්වර දෙවියන් යන්න යි.

මහසෙන් රජතුමා වැව් අමුණු තනවා ආර්ථිකයට කළ මෙහෙය නිසා එතුමා මින්නේරිය දෙවියන් ලෙස පූජනීයත්වයට ලක් විය. වර්තමානයේ ද මහසෙන් දෙවියන්ට වෙන් වූ දේවාල වියලි කලාපයේ දක්නට තිබේ.

පළමුවන කාශ්‍යප රජතුමා *කුවේර* ලෙස පෙනී සිටියේ ය. එරජු හැඳින්වීමට සෙල්ලිපියක '*අලකපය මහරජ*' යන යෙදුම භාවිත කර තිබේ. එයින් අදහස් කරන ලද්දේ ආලකමන්දාධිපති මහරජු යන්න යි. ආලකමන්දාව යනු ධනයට අධිපති ලෙස සැලකෙන කුවේරගේ වාසභවන යි. ආලකමන්දාව යනු පර්වතයක් බව සාහිත්‍ය මූලාශ්‍රයවල සඳහන් වේ. *පර්වතරාජ* යන සංකල්පයෙන් පෙනි සිටීම පැරණි කාලයේ ආසියාවේ පාලකයෝ අනුගමනය කළ පිළිවෙතකි.

රජු *බෝධිසත්ත්වයෙකු* ලෙස පෙනි සිටීම ද මීට අදාළ තවත් ආකාරයකි. රජු සිය ජනතාවගේ හිතසුව පිණිස සාධාරණ යුක්තිගරුක දැහැමි පාලනයක් පවත්වා ගෙන යාමට වගකීමෙන් බැඳී සිටින බව එක් අතකින් එයින් පෙන්නුම් කළ අතර තවත් අතකින් ජනතාව රජු කෙරෙහි විශ්වාසය හා ගෞරවය දැක්විය යුතු ආකාරයත් එයින් පිළිබිඹු කෙරිණි.

මෙරට රජවරුන් විසින් අනුදක්නා ලද තවත් අදහසක් වුයේ චක්‍රවර්තී සංකල්පය යි. චක්‍රවර්තී යනු සමස්ත ලෝකයට ම අධිපති යන තේරුම ලබා දෙන සංකල්පයකි. සංස්කෘත භාෂාවට අයත් එම පදය සිංහල භාෂාවේ දී ව්‍යවහාර වන්නේ සක්විති යනුවෙනි. ක්‍රිස්තුවර්ෂයෙන් නමවන සහ දහවන සියවස්වල දී මෙරට ඇතැම් පාලකයෝ මෙම යෙදුම සිය අනන්‍යතාව පිළිබිඹු කිරීමට යොදා ගත්හ. විශේෂයෙන් ම නිශ්ශංකමල්ල රජතුමා සිය සෙල්ලිපිවල තමන් හඳුන්වා ගැනීමට *කාලිංග චක්‍රවර්ති ස්වාමීන් වහන්සේ* යන පදය භාවිත කළේ ය.

රාජ්‍යත්වය පිළිබඳ විවිධ ව්‍යවහාර දක්නට තිබූණ ද ඒ සෑම සංකල්පයක් ම රජුගේ උසස් බව හැඟ වීමට භාවිත කරන ලද ඒවා ය. පාලකයා වටා එවැනි උතුම් බවක් නිර්මාණය වීමේ දී පාලකයා ආදර්ශවත් වීම ජනතාවගේ බලාපොරොත්තුව විය. ඉන් එසේ ක්‍රියා කිරීමට පාලකයාට ද බලපෑමක් ඇති වීම ස්වාභාවික ය. ධාර්මික රාජ්‍ය පාලනයකට අවශ්‍ය සංකල්පීය පදනම නිර්මාණය වූයේ එලෙස ය.

### රාජ්‍ය උරුමය

පැරණි ශ්‍රී ලංකාවේ රාජ්‍ය උරුමය ලැබුණු ආකාරය විමසා බැලීමේ දී එය සහෝදරයාගෙන් සහෝදරයාට හෝ පියාගෙන් පසු පුතාට එය හිමි වූ බව පෙනී යයි.

දේවානම්පිය තිස්ස රජුගේ අභාවයෙන් පසු ඔහුගේ සොහොයුරෝ රජකමට පත් වූහ. දුටුගැමුණු රජුට පසුව බලයට පත් වූයේ ඔහුගේ සොයුරු සද්ධාතිස්සය. සහෝදරයාගෙන් සහෝදරයාට රජකම හිමි වීමේ දී බොහෝ දුරට රජුට බාල සොයුරන් අතරින් වැඩිමහල් ම සොයුරාට බලය හිමි වී ඇත. එසේ නොවුණු අවස්ථාවල දී ගැටුම් පැවති බව ඉතිහාසය දෙස බැලීමේ දී පෙනී යයි.

පියාගෙන් පුතාට රජකම උරුම වීම දක්නට ලැබෙන සුලබ සිදුවීමකි. කාවන්තිතිස්ස රජුගෙන් පසු දුටුගැමුණුට රජකම හිමි විය වසභ රජුගේ ඇවෑමෙන් ඔහු පුත් වංකනාසිකතිස්සට ද රජකම හිමි විය. මෙසේ පියාගෙන් පුතාට රජකම හිමි වීම ශ්‍රී ලාංකේය ඉතිහාසය පුරා දක්නට ලාබෙන අතර එය රජුගේ වැඩිමහල් පුත්‍රයා නැතිනම් අගබිසවගේ වැඩිමල් පුත්‍රයා හට උරුම විය. එසේ නොවූ අවස්ථාවල දී ගැටුම් ඇති වූ බවට ඉතිහාසයේ සාක්ෂි ඇත. කාශ්‍යප රජු තම පියා වූ ධාතුසේන රජුගෙන් රාජ්‍යය පැහැරගත් බව අප දන්නා කරුණකි. රජුට එසේ කිරීමට සිදු වූයේ ධාතුසේන රජුගේ අගබිසවගේ පුතා වූ මුගලන් කුමරු රාජ්‍යයත්වයේ නියම හිමිකරු වූ බැවිනි. කාශ්‍යප කුමරුගේ මව ධාතුසේන රජුගේ දෙවන බිසවකි.

මීට අමතරව රජුගේ බිසවගේ සොයුරාට හා රජුගේ සොයුරියගේ පුත්‍රයාට රජකම හිමි වූ අවස්ථා ද ඇත. එසේ වූයේ ඉහත කී ආකාරයට නියම හිමිකරුවකු නොවූ අවස්ථා වලය.

### රාජ්‍ය තන්ත්‍රය

දේශපාලන බලය විමධ්‍යගතව පැවති අවධියේ පරුමකවරුන්ව සිටි බොහෝදෙනා ඒකාබද්ධ කර රාජ්‍යය ගොඩනැගුණු හෙයින් රජු සියලු පරුමකවරුන්ගේ ප්‍රධානියා ලෙස කටයුතු කළේ ය. එහෙයින් රජු හැඳින්වීමට මහාපරුමක හෙවත් මපුරුමුකා යන පදය භාවිත විය. බලය මධ්‍යගත වීමට පෙර අවධියේ දී ඇතැම් බලවත් පරුමකවරුන් රජ යන ව්‍යවහාරය භාවිත කළ අයුරු මෙයට පෙර සඳහන් කෙරිණි. එහෙත් දේශපාලන බලය මධ්‍යගත වූ පසු රටේ පාලකයා හැඳින්වීමට භාවිත කරන ලද්දේ මහරජ යන පදය යි.

ශ්‍රී ලංකාවේ දේශපාලන බලය මධ්‍යගත වීමෙන් පසු ගොඩනැගුණු රාජ්‍ය පරිපාලන සැකැස්මට අයත් වූ නිලධාරීන් තන්ත්‍රයේ ව්‍යුහය කෙබඳු වී දැයි මෙරට පැරණිත ම සෙල්ලිපි ඇසුරෙන් තරමක් දුරට තේරුම් ගත හැකි ය.

මහරජ (මපුරුමුකා)

⬇

මහඇමති (මහමත)

⬇

ඇමතිවරු (අමෙත) + සේනාපතිවරු (ශෙනපති)

⬇

භාණ්ඩාගාරික (බඩගරික)

⬇

භෝජනශාලා අධිකාරී (බතගු)

⬇

චත්සිරිත් සහ චාරිත්‍ර පිළිබඳ අධිකාරී (කොතුරුගැ නා)

⬇

නගර පරිපාලක (නගරගුතික)

⬇

නාගරික වාස්තුවිද්‍යාඥ (නගර වුඩික) + අශ්ව අංශයේ ප්‍රධානි (අස අදෙක)+ ඇත් අංශයේ ප්‍රධානි (හති අදෙක) +නාට්‍ය අංශයේ ප්‍රධානි (නට අදෙක)+ කාසි අච්චු ගැසීමේ අංශ ප්‍රධානි (රුප අදෙක) + වෙළඳ කටයුතු භාර ප්‍රධානි (පන අදෙක) + රාජ්‍ය ලේඛනාගාර ප්‍රධානි (කනපෙඩික)

මේ ආකාරයේ නිලධාරී තන්ත්‍රයක් මගින් පාලනය ගෙන යාමට මහත් පිටිවහලක් ලැබිණි. ඉන් වඩාත් ප්‍රයෝජනය ලැබුනේ රටේ පොදු මහජනතාවට ය.

## 3.3 මෙරට පාලනය කළ ශ්‍රේෂ්ඨ රජවරු

ශ්‍රී ලංකාවේ දේශපාලන බලය වර්ධනය වීම දිගුකාලයක් තිස්සේ සිදු වෙමින් තිබූ සමාජආර්ථික ක්‍රියාවලියක බලපෑමට ලක් වෙමින් සිදු වූ ආකාරය මෙතෙක් සාකච්ඡා කළ කරුණුවලින් ඔබට පැහැදිලි වන්නට ඇත. විශේෂයෙන් ම ක්‍රිස්තු පූර්ව පළමුවන සියවසේ අගභාගය වන විට ඉන්දියානු සාගරයේ ක්‍රියාත්මක වෙමින් පැවති අන්තර්ජාතික වෙළෙඳ කටයුතුවලින් නියමිත ප්‍රතිලාභ හිමි කර ගැනීමට නම් බෙදී ගිය පාලනයකට වඩා කාර්යක්ෂම වන්නේ මධ්‍යගත පාලනයක් බව අවබෝධ කර ගත් පාලකයෝ ඒ සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කළහ. ශ්‍රී ලංකාවේ දේශපාලන බලය වර්ධනය වීමට සමාන්තරව පාලකයින් විසින් අනුගමනය කළ ප්‍රතිපත්ති සහ ඔවුන්ගේ දායකත්වය මෙරට පාලනය කළ රජවරු කිහිප දෙනෙකු ඇසුරෙන් මෙම කොටසේ දී සාකච්ඡා කිරීමට නියමිත ය.

### දුටුගැමුණු රජතුමා

ඓතිහාසික මූලාශ්‍රය මගින් විස්තරාත්මක ලෙස හුවා දක්වන දුටුගැමුණු රජතුමා මෙරට දේශපාලන බලය නිසි අයුරින් සංවිධානය කිරීමට ඉතා වැදගත් මෙහෙයක් ඉටු කළ පාලකයෙකි. එතුමාගේ කාලය වන විට ශීඝ්‍රයෙන් දියුණු වෙමින් තිබූ ඉන්දියානු සාගරයේ වෙළෙඳ කටයුතු නිසා සරු ආදායමක් උපදවන ලද මාතොට අන්තර්ජාතික වරාය එවක අනුරාධපුරයේ බලය හිමි කර ගෙන සිටි එළාර නම් පාලකයාගේ අණසකින් මුදා ගෙන රට එක්සත් කිරීමේ අවශ්‍යතාව වටහා ගැනීමට එතුමා සමත් විය. සිය පියා වූ කාවන්තිස්ස මහරජතුමාගේ අවවාද අනුශාසනා සහ සැලසුම් අනුව කටයුතු කරමින් ඒ සඳහා දුටුගැමුණු කුමරු ක්‍රියා කළ ආකාරය මෙරට දේශපාලන ඉතිහාසයේ වැදගත් සන්ධිස්ථානයකි. මෙරට ඉතිහාසයේ ප්‍රථම සංවිධානාත්මක සටන් ව්‍යාපාරයට නායකත්වය දෙන ලද්දේ එතුමා විසිනි. තමා විසින් එළාර රජුට එරෙහිව කරන සටන හුදෙක් ම තමාගේ පෞද්ගලික රජසැප පිණිස කරන්නක් නොව එය බෞද්ධ ශාසනයේ යහපත උදෙසා සිදු කරන්නක් බව ප්‍රකාශයට පත් කිරීමෙන් පාලකයා රට වෙනුවෙන් පොදු අරමුණක් මුල් කර ගනිමින් දේශපාලන ක්‍රියාවලියකට එළඹෙන ආකාරය පෙන්වා

දෙයි. සටන නිමා වීමෙන් පසුව පරාජයට පත් සිය ප්‍රතිමල්ලවයාගේ සොහොනට නිසි ගෞරවාචාර පැවැත්වීමට අණ කිරීමෙන් සිය රාජතාන්ත්‍රික බව පළ කිරීමට එතුමා කටයුතු කළේය.

මෙම පාඩමේ රාජ්‍යයත්වය වර්ධනය කොටසේ දී පැහැදිලි කළ අන්දමට ඒ වන විටත් විමධ්‍යගතව පැවති ප්‍රාදේශික බලය හිමි කරගත් පරුමකවරුන් ඒකාබද්ධ කර ගැනීමට සමත් වීම දුටුගැමුණු රජු විසින් මෙරට දේශපාලන බලය වර්ධනය වීමේ ක්‍රියාවලියට දැක්වූ වැදගත් ම දායකත්වය යි. අවසානයේ රටේ මහරජු ලෙස අභිෂේක ලැබූ එතුමාට මහත් බලයක් හිමි විය. තමා කෙතරම් බලසම්පන්න වුව ද පාලකයා ලෙස තමාගේ වගකීම ජනතාවගේ සුභසිද්ධිය සැලසීම බව වටහා ගැනීමට එතුමා සමත් වූ බව ජනතාව වෙත දැක් වූ සහනශීලී ආකල්පය මගින් පිළිබිඹු වේ. රුවන්වැලි මහාසෑය ඉදි කරන කාලය තුළ එහි සතර දොරටුවේ දන්සැල් පැවත්වීමත්, ස්තූපය ඉදි කිරීමට සහභාගි වන සියලු දෙනාට වැටුප් ගෙවීමට නියම කිරීමත් ඊට නිදසුනකි. දුටුගැමුණු රජතුමා පිළිබඳ අගය කළ යුත්තේ එතුමා මෙරට බුදුදහම වෙනුවෙන් ඉටු කළ සේවය නිසා පමණක් ම නොවේ. විමධ්‍යගතව පැවති ශ්‍රී ලංකාවේ දේශපාලන බලය වඩාත් ශක්තිමත් පදනමක සංවිධානය කිරීමට මුල් වී කටයුතු කිරීම ද ඒ රජතුමාගේ ක්‍රියාකලාපයෙන් ඉස්මතු වී පෙනෙන තවත් විශේෂ ලක්ෂණයකි.

## වසභ රජතුමා

ලම්බකර්ණ වංසයේ ආරම්භක පාලකයා වූ වසභ රජතුමා මෙරට පාලකයින් අතර තවත් කැපී පෙනෙන චරිතයකි. රටේ අභ්‍යන්තර පාලනය විධිමත් ලෙස සංවිධානය කිරීමට එතුමා විසින් අනුග මනය කරන ලද ක්‍රියාපිළිවෙත ආදර්ශවත් ය. එතුමා විසින් දිවයිනේ නොයෙක් ප්‍රදේශවල පිහිටුවන ලද සෙල්ලිපි විශාල ප්‍රමාණයක් තිබේ. ඒවායේ සඳහන් කර තිබෙන තොරතුරුවලට අනුව ඒ රජතුමා මෙරට පළාත් බෙදා පරිපාලනය විධිමත් කිරීමට උත්සාහ කළේය. එමෙන්ම රජයේ බදු අය කිරීම වඩාත් ක්‍රමවත් වුයේ ද මෙරජුගේ පාලන කාලයේ දී බව එතුමා විසින් පිහිටුවන ලද සෙල්ලිපිවලින් පැහැදිලි වේ.

පළමුවරට මේ රටේ විශාල ප්‍රමාණයේ වැව් ඉදි කිරීමට පුරෝගාමී වුයේ වසභ රජතුමා බව ඓතිහාසික මූලාශ්‍රයවල සඳහන් තොරතුරුවලින් අනාවරණය වේ. එරජු විශාල ප්‍රමාණයේ වැව් දහසයක් ඉදි කර වූ බව වංසකථාවල විස්තර කර තිබේ. මෙවැනි කටයුත්තක් සඳහා හිටිවන ම නැඹුරු වීමට හේතුව දකුණු ඉන්දියාවේ ක්‍රිෂ්ණ ගංගා නිම්නයේ ඇති වූ ආහාර හිගයක් හේතුවෙන් මෙරට නිපදවන ධාන්‍ය සඳහා විශාල ඉල්ලුමක් ඇති වීම යි. වහා නව ජලාශ ඉදි කිරීමට රජයේ මුදල් වැය කිරීමට වසභ රජතුමා විසින් ගන්නා ලද තීරණය එවක පැන නැගුණු අන්තර්ජාතික කලාපීය අවශ්‍යතාවකට මුහුණ දීම සඳහා ගත් සාධනීය වූත් දුරදක්නා වූත් තීරණයකි.

මෙරට බෞද්ධ වෙහෙරවිහාර ප්‍රතිසංස්කරණය සඳහා වසභ රජතුමා විසින් ක්‍රියා කළ ආකාරය අන් කිසිදු පාලකයෙකුගේ ක්‍රියාකලාපයට නොදෙවෙනි ය. බෞද්ධ විහාරවල දිරූ තැන් ප්‍රතිසංස්කරණය සඳහාත් භික්ෂූන් වහන්සේලාගේ සිව්පසය සපයා ගැනීමටත් එරජු විසින් විහාරවලට දෙන ලද දීමනා සඳහන් සෙල්ලිපි රාශියක් තිබේ.

රටේ දේශීය ආදායම වැඩි කර ගැනීමට අවශ්‍ය කරන පදනම සකස් කොට ඒ ලැබෙන ආදායම භාවිත කොට රටේ වාරිමාර්ග දියුණු කිරීමටත් එමගින් රටේ ජනතාවගේ ජීවිතය යහපත් කිරීමටත් වසභ රජතුමා විසින් ගන්නා ලද තීරණ ආදර්ශවත් බව වටහා ගත යුතු ය.

## පළමුවන විජයබාහු රජතුමා

මෙරට ඉතිහාසයට අයත් තවත් ශ්‍රේෂ්ඨ පාලකයකු ලෙස කැපී පෙනෙන්නේ පළමුවන විජයබාහු රජතුමා යි. දකුණු ඉන්දියානු චෝළ රජවරුන්ගේ බලය වර්ධනය වී අනතුරුව ශ්‍රී ලංකාව දීර්ඝ කාලයක් චෝළ පාලනයට නතුව තිබූ අවධියක ඉතාමත් සිහි නුවණින් යුතුව සැලසුම් සහගත ආකාරයකට සංග්‍රාම ව්‍යාපාරයකින් චෝළ බලය මැඩ පැවැත්වීමට ඒ රජතුමා ක්‍රියා කළේ ය.

කුඩා කාලයේ දී කීර්ති නමින් හැඳින්වූ එරජතුමා රුහුණ ප්‍රදේශයට ගොස් එහි හැදී වැඩිණි. කීර්ති කුමරුන්ටත් ඔහුගේ දෙමව්පියන් ඇතුළු රාජකීය පවුලටත් එහි දී රැකවරණය සපයන ලද්දේ රුහුණේ වාසය කළ රජයේ නිලධාරියෙකි. ඔහු නමින් සිත්නාරුබිම බුදල් නා වේ. ඔහු ආරක්ෂක නිලධාරියෙකි. බුදල් නා විසින් රාජකීය පවුලට ලබා දෙන ලද රැකවරණයේ ස්වභාවය පිළිබඳ කදිම විස්තරයක් පළමුවන විජයබාහු රජතුමා විසින් ලියවන ලද පනාකඩුව තඹ සන්නසේ ඇතුළත් ය.

බලවත් චෝළ පාලකයින්ට විරුද්ධව කටයුතු



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

කිරීමට පළමුවන විජයබාහු රජතුමා විසින් ගන්නා ලද සියලු පියවර රටේ සමස්ත භූමියේ පැවැත්ම ආරක්ෂා කර ගැනීම උදෙසා අනුගමනය කරන ලද සාධනීය පිළිවෙතකි. කිසියම් රටක භූමියේ නිදහස සහ අඛණ්ඩතාව යන සංකල්ප හඳුන්වනු ලබන්නේ භෞමික අඛණ්ඩතාව යන නමිනි. කිසියම් පාලකයකු විසින් රටක භෞමික අඛණ්ඩතාව ආරක්ෂා කිරීම රටවැසියන් වෙනුවෙන් ඔහු විසින් ඉටු කළ යුතුව තිබෙන ප්‍රධාන වගකීමකි.

සටන් ව්‍යාපාරයක් මගින් චෝළ පාලකයින් පරදා රට නැවතත් එක් සේසත් කළ විජයබාහු රජතුමා අනතුරුව රට සංවර්ධනය කිරීමට මහත් වෙහෙසක් දැරී ය. චෝළ පාලන සමයේ දී නිසි අයුරින් නඩත්තු නොවූ බෞද්ධ වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කිරීමට එතුමා වහා කටයුතු කළේය. රටේ ආර්ථිකය සවිමත් කිරීමට එරජතුමා ඉතා වැදගත් පියවරක් අනුගමනය කළේය. ඒ අනුරාධපුරය වෙනුවට පොළොන්නරුව සිය පාලන මධ්‍යස්ථානය බවට පත් කර ගැනීම යි. මෙවැනි පියවරක් ගැනීමට එතුමා පෙලඹුණේ ඒ වන විටත් එතෙක් ඉන්දියානු සාගරයේ බටහිර ප්‍රදේශ මූලික කොට ගෙන පැවති අන්තර්ජාතික වෙළෙඳාම නැගෙනහිර ඉන්දියානු සාගර කලාපයට මාරු වීම නිසා ය. එම පරිවර්තනය ශ්‍රී ලංකාවට වඩා වැදගත්වන්නේ ඉන්දියානු සාගරයේ නැගෙනහිර කොටස සමඟ පහසුවෙන් සම්බන්ධතා පැවැත්විය හැකි ආකාරයට පරිපාලනය සංවිධානය කර ගැනීම යි. විජයබාහු රජතුමාට පෙර විසූ පාලකයින් කිහිප දෙනෙකු මේ සම්බන්ධයෙන් අවධානය යොමු කොට තිබුණ ද ඒ සම්බන්ධයෙන් ප්‍රායෝගික ලෙස ක්‍රියා කරන ලද්දේ විජයබාහු රජතුමා විසිනි. පොළොන්නරුව පාලන මධ්‍යස්ථානය වශයෙන් තෝරා ගැනීමට බලපෑ එක් ප්‍රධාන හේතුවක් ලෙස පෙනෙන්නේ ගෝකණ්ණතිත්ථ යනුවෙන් එකල හැඳින්වූ වර්තමාන ත්‍රිකුණාමල වරාය ඉන්දියානු සාගරයේ නැගෙනහිර කොටසට මුහුණ ලා පිහිටා තිබීමත් එම වරායේ වෙළෙඳ කටයුතු පාලනය කිරීම වඩා පහසුවන්නේ පොළොන්නරුවේ සිට පාලනය කිරීමෙන් බව පාලකයින් වටහා ගැනීම ය.

පළමුවන විජයබාහු රජතුමා පාලකයෙකු වශයෙන් ක්‍රියා කළ ආකාරය පොළොන්නරු යුගයේ ඉතිහාසය කෙරෙහි මහත් බලපෑමක් ඇති කළේ ය. පසුකලෙක යුරෝපීය ජාතීන් විසින් මෙරටට බලපෑම් එල්ල කරන තුරු ශ්‍රී ලංකාවේ ස්වෛරීත්වය අරාක්ෂා වූයේ එකල රජවරුන්ගේ බුද්ධි මහිමයේ සහ ප්‍රතාපවත් අදහස්වල ප්‍රතිඵලයක් වශයෙනි.

**ක්‍රියාකාරකම් 1**

පහත සඳහන් නම්වලින් හැඳින්වූ පුද්ගලයින් කවුරුන්දැයි විස්තර කරන්න

1. ගෘහපති
2. ගමික
3. පරුමක
4. රජ

**ක්‍රියාකාරකම් 2**

අනුරාධපුර හා පොළොන්නරු යුගවල රට පාලනය කළ කැපී පෙනෙන රජවරු පිළිබඳ කෙටි සටහනක් ලියන්න.

**වැදගත් කරුණු**

1.මුල් අවධිවල ශ්‍රී ලංකාවේ දේශපාලන බලය පැවතියේ විමධ්‍යගත ස්වරූපයකිනි. ප්‍රාදේශීයව බලවත්ව සිටි දේශීය ප්‍රභූන් විසින් පාලන බලය මෙහෙයවන ලදී.

2.ගම් මට්ටමින් පාලන කටයුතුවලට සහභාගි වූවන් ගමිකයින් ලෙස ද, ගම් කිහිපයකින් සකස් වූ වඩා පුළුල් ප්‍රදේශයක් පාලනය කළ පුද්ගලයින් පරුමකයින් ලෙස ද හැඳින්විණි. ගමිකයින් නියෝජනය කරන ලද්දේ ගමක පිහිටි ගෙවල් කිහිපයකට අධිපතිව සිටි ගෘහපතින් ය. එවැන්නන් හැඳින්වීමට භාවිත කරන ලද්දේ ගහපති යන පදය යි.

3. ජනාවාස වර්ධනය වීමත් ඊට සමගාමීව සමාජයේ විවිධ අවශ්‍යතාවන් පැන නැගීමත් ඒ අනුව ජීවන තරඟකාරීත්වය ඇති වීමත් යන කරුණු හේතු කොට ගෙන සමාජයක් තුළ ඇති වන ගැටුම් සහ වෙනත් ව්‍යාකූලතා පාලනය කිරීමට අවශ්‍ය කරන බලය මෙහෙයවීමට දේශපාලන සංස්ථා අවශ්‍ය ය. ශ්‍රී ලකාවේ පැරණි සමාජය තුළ දේශපාලන බලය වර්ධනය වන්නේ ද එවැනි අවශ්‍යතා පදනම් කර ගෙන ය.

4.විමධ්‍යගතව පැවති මෙරට දේශපාලනය මධ්‍යගත කිරීමේ ව්‍යාපාරය ආරම්භ කරන ලද්දේ දුටුගැමුණු රජතුමා විසිනි. දේශපාලන අරමුණක් උදෙසා පළමුවරට මෙරට ඉතිහාසයේ දුටුගැමුණු

රජතුමා ආරම්භ කළ එම කටයුත්ත පරිණතියට පත්වන්නේ ලම්බකර්ණවංශික වසභ රජතුමාගේ පාලන සමයේ දී ය.

5.දේශපාලන බලය කේන්ද්‍රගත වීම යනු රටේ පාලනය එක් පාලකයකුගේ අණසක යටතට පත් වීම යි. එහි දී රටේ පරිපාලනය පවත්වා ගෙන යාම සඳහා නිශ්චිත රාජ්‍ය නිලධාරීන් මණ්ඩලයක් නිර්මාණය වේ. රජු ඇතුළු එම මණ්ඩලය සහ ඔවුන් විසින් පනවනු ලබන නීතිරීතිවලටත් ඒවා ක්‍රියාත්මක කරන ආයතනවලටත් 'රජය' යන ව්‍යවහාරය යෙදේ.

6.පාලනය ගෙන යාමේ දී පාලකයෝ නොයෙකුත් සංකල්ප අනුව පෙනී සිටියෝ ය. දේවත්වයක් ආරූඪ කර ගැනීමට බොහෝ අවස්ථාවල ඔවුහු වෑයම් කළ හ.

*පංචකකුධ භාණ්ඩ පංචකකුධ භාණ්ඩ යනුවෙන් හැඳින්වෙන්නේ පරිහරණය කිරීමේදී සෞභාග්‍යය උදා කරනු ඇතැයි සැලකෙන භාණ්ඩ පහකි. ඊට වල්විදූනාව මිරිවැඩි සඟල, මගුල්කඩුව, සේසත සහ නළල් පටිය අයත් වේ. පංචකකුධ භාණ්ඩ භාවිත කර තිබෙන්නේ රජුන් සිය අභිෂේක උත්සවවල දී ය. ඉන්දියාවේ අශෝක රජතුමා විසින් එවන ලද පංචකකුධ භාණ්ඩ යොදා ගෙන දේවාම්පියතිස්ස රජතුමා දෙවන වරටත් අභිෂේක ලැබූ බව මහාවංසයේ සඳහන් ය.*

*දෙවනපිය අභිධානය "දෙවියන්ට ප්‍රිය වූ" යන අර්ථය ඇති දෙවනපිය (දේවානම්ප්‍රිය) අභිධානය භාවිත කරන ලද්දේ ප්‍රතාපවත් ඉන්දියානු අධිරාජයෙකු වූ අශෝක රජතුමා විසිනි. ඒ රජතුමාට සමකාලීන අවදියේ මෙරට පාලනය කළ තිස්ස රජු ද එම අභිධානය භාවිත කරමින් දේවානම්පියතිස්ස යනුවෙන් සිය නම භාවිත කළේය.*

*ආලකමන්දාව ආලකමන්දාව යනු ධනයට අධිපති කුවේරගේ වාසභවනය පිහිටි ස්ථානය ලෙස සාහිත්‍යකෘතිවල විස්තර කර තිබේ. ඒ අනුව දෙවියන් ගැවසෙන එය උතුරුකුරු දිවයිනට අයත් සමෘද්ධිමත් නගරවලින් එකක් ලෙස සාහිත්‍යයේ විස්තර කෙරේ.*



*නොමිලේ බෙදා හැරීම සඳහා ය.*